# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2025

# 10 - සංයුක්ත ගණිතය I

## ලකුණු දීමේ පටිපාටිය

**I පත්‍රය**

| | | | |
|---|---|---|---|
| **A කොටස** | **= 10 × 25** | **=** | **250** |
| **B කොටස** | **= 05 × 150** | **=** | **750** |

**එකතුව** $= \dfrac{1000}{10}$

**අවසන් ලකුණ = 100**

## A කොටස

1. ගණිත අභ්‍යුහන මූලධර්මය භාවිතයෙන්, සියලු $n \in \mathbb{Z}^+$ සඳහා $9(2^n) < (n+3)!$ බව සාධනය කරන්න.

$n=1$ සඳහා වි.පැ. $= 9.2^1 = 18$ හා ද.පැ. $= 4! = 24$ බැවින් වි.පැ. < ද.පැ. වේ.

$\therefore n=1$ සඳහා ප්‍රතිඵලය සත්‍ය වේ. (5)

ඕනෑම ධන පූර්ණ සංඛ්‍යාමය $k$ ගෙන, ප්‍රතිඵලය

$n=k$ සඳහා සත්‍ය යැයි උපකල්පනය කරමු.

එනම් $9 \cdot 2^k < (k+3)!$ වේ. (5)

$\therefore 9 \cdot 2^{k+1} < 2 \cdot (k+3)!$ (5)

$< (k+4)(k+3)!$ (5) $(\because 2 < k+4)$

$= (k+4)!$

එබැවින් $9 \cdot 2^{k+1} < (k+4)!$ වේ.

ඒ නයින්, $n=k$ සඳහා ප්‍රතිඵලය සත්‍ය නම් $n=k+1$ සඳහා ද ප්‍රතිඵලය සත්‍ය වේ.

$n=1$ සඳහා ප්‍රතිඵලය සත්‍ය බව සාධනය කර ඇත.

ඒ නයින්, ගණිතමය අභ්‍යුහන මූලධර්මය මගින් ප්‍රතිඵලය

සියලු $n \in \mathbb{Z}^+$ සඳහාම සත්‍ය වේ. (5)

**2.** එකම රූප සටහනක $y=|x-2|+2$ හා $y=7-|x+3|$ හි ප්‍රස්තාරවල දළ සටහන් අඳින්න.
ඒ නයින්, $|x-2|+|x+3|=5$ සමීකරණය විසඳන්න.




$$|x-2|+|x+3|=5$$

$$\Leftrightarrow |x-2|+2=7-|x+3|.$$ (5)

රූප සටහනෙන්, $-3 \le x \le 2$. (5)

**3.** ආගන්ඩ් සටහනක, $|\text{Arg}(z-2i)| = \frac{\pi}{4}$ සමීකරණය සපුරාලන $z$ සංකීර්ණ සංඛ්‍යා නිරූපණය කරන ලක්ෂ්‍යවල පථයෙහි දළ සටහනක් අඳින්න.
**ඒ නයින් හෝ අන් අයුරකින් හෝ,** $|\text{Arg}(\overline{z}+2i)| = \frac{\pi}{4}$ සපුරාලන $z$ සඳහා $|z-1|$ හි අවම අගය සොයන්න.




$$\left.\begin{aligned}|\text{Arg}(\overline{z}+2i)| &= |\text{Arg}(\overline{z-2i})| \\ &= |\text{Arg}\,(z-2i)|\end{aligned}\right\}\ (5)$$

$\therefore\ |\text{Arg}\,(\overline{z}+2i)| = \frac{\pi}{4}$ යන්න හා $|\text{Arg}\,(z-2i)| = \frac{\pi}{4}$ යන්න එකම වේ.

අවශ්‍ය අවමය $= 1\sin\frac{\pi}{4} = \frac{1}{\sqrt{2}}$. (10)

**4.** $n \in \mathbb{Z}^+$ ඔත්තේ පූර්ණ සංඛ්‍යාවක් යැයි ගනිමු. $\left(\sqrt{x}-\dfrac{x}{n}\right)^n$ හි ද්විපද ප්‍රසාරණයෙහි $x^2$ පදයක් අන්තර්ගත වන බව දී ඇත. $n = 3$ බව පෙන්වා, $x^2$ හි සංගුණකය සොයන්න.

$$\left(\sqrt{x}-\frac{x}{n}\right)^n = x^{\frac{n}{2}}\left(1-\frac{\sqrt{x}}{n}\right)^n$$

$$= x^{\frac{n}{2}}\sum_{r=0}^{n} {}^nC_r(-1)^r\frac{x^{\frac{r}{2}}}{n^r}$$ (5) හෝ සාධාරණ පදය

$$= \sum_{r=0}^{n}\frac{(-1)^r}{n^r}\,{}^nC_r\, x^{\frac{n+r}{2}}$$

අපට $\dfrac{n+r}{2} = 2$ වීම අවශ්‍ය වේ. (5)

$\therefore n+r = 4.$

මෙයින් $n \le 4$ ලැබේ.

$n \in \mathbb{Z}^+$ ඔත්තේ බැවින් $n=1$ හෝ $n=3$ විය යුතු ය. (5)

$n=1$ නම් $r=3$ වන අතර $r \le n$ බැවින් මෙය විය නොහැක.

$n=3$ නම් $r=1$ වන අතර මෙය අවශ්‍යතා තෘප්ත කරයි.

$\therefore n=3$. (5)

$x^2$ හි සංගුණකය $= \dfrac{(-1)}{3}\,{}^3C_1 = -1.$ (5)

$\frac{3}{2}n - \frac{r}{2} = 2$

$3n - r = 4$

<u>**වෙනත් ක්‍රමයක්**</u>

$$\left(\sqrt{x}-\frac{x}{n}\right)^n = \sum_{r=0}^{n} {}^nC_r\, x^{\frac{r}{2}}.\frac{(-1)^{n-r}}{n^{n-r}}x^{n-r}$$ (5) හෝ සාධාරණ පදය

$$= \sum_{r=0}^{n} \frac{(-1)^{n-r}}{n^{n-r}}\, {}^nC_r\, x^{n-\frac{r}{2}}$$

අපට $n-\frac{r}{2}=2$ වීම අවශ්‍ය වේ. (5)

$\therefore r = 2n-4.$

$r \le n$ බැවින් $n \le 4$ අපට ලැබේ.

$n \in \mathbb{Z}^+$ ඔත්තේ බැවින් $n=1$ හෝ $n=3$ විය යුතුය. (5)

$n=1$ නම් $r=-2$ වන අතර මෙය විය නොහැක.

$n=3$ නම් $r=2$ වන අතර මෙය අවශ්‍යතා තෘප්ත කරයි.

$\therefore n=3.$ (5)

$x^2$ හි සංගුණකය $= \frac{(-1)}{3}\, {}^3C_2 = -1.$ (5)

5. $\lim\limits_{x\to 0} \dfrac{\tan x - \sin x}{x\left(\sqrt{3x^2+1}-\sqrt{x^2+1}\right)} = \dfrac{1}{2}$ බව පෙන්වන්න.

$$\lim_{x\to 0} \frac{\tan x - \sin x}{x\left(\sqrt{3x^2+1}-\sqrt{x^2+1}\right)}$$

$$=\lim_{x\to 0} \frac{\tan x - \sin x}{x\left(\sqrt{3x^2+1}-\sqrt{x^2+1}\right)} \cdot \frac{\left(\sqrt{3x^2+1}+\sqrt{x^2+1}\right)}{\left(\sqrt{3x^2+1}+\sqrt{x^2+1}\right)} \quad (5)$$

$$=\lim_{x\to 0} \frac{\sin x}{x} \cdot \frac{(1-\cos x)}{2x^2} \cdot \frac{\left(\sqrt{3x^2+1}+\sqrt{x^2+1}\right)}{\cos x}$$

(5)

$$=\lim_{x\to 0} \frac{\sin x}{x} \cdot \frac{\sin^2\left(\frac{x}{2}\right)}{\left(\frac{x}{2}\right)^2} \cdot \frac{\left(\sqrt{3x^2+1}+\sqrt{x^2+1}\right)}{4\cos x} \quad (5)+(5)$$

$$=1\times 1^2 \times \frac{2}{4} \quad (5)$$

$$=\frac{1}{2}.$$

6. $k > 0$ යැයි ගනිමු. $y=\left(e^{kx}-e^{-kx}\right)^2\sqrt{e^{kx}+e^{-kx}}$ , $y=0$, $x=-\frac{1}{k}$ හා $x=\frac{1}{k}$ වක්‍ර මගින් ආවෘත වන පෙදෙ x-අක්ෂය වටා රේඩියන $2\pi$ වලින් භ්‍රමණය කරනු ලැබේ. මෙලෙස ජනනය වන ඝන වස්තුවේ පරිමා $\frac{2\pi}{5k}\left(e-\frac{1}{e}\right)^5$ බව පෙන්වන්න.

$$\text{අවශ්‍ය පරිමාව} = \pi\int_{-\frac{1}{k}}^{\frac{1}{k}}\left(e^{kx}-e^{-kx}\right)^4\left(e^{kx}+e^{-kx}\right)dx \quad (5)$$

$$=2\pi\int_{0}^{\frac{1}{k}}\left(e^{kx}-e^{-kx}\right)^4\left(e^{kx}+e^{-kx}\right)dx$$

$$=2\pi\int_{0}^{e-\frac{1}{e}}\frac{u^4}{k}du \quad (5)$$

$$=2\pi\left.\frac{u^5}{5k}\right|_{0}^{e-\frac{1}{e}} \quad (5)$$

$$=\frac{2\pi}{5k}\left(e-\frac{1}{e}\right)^5. \quad (5)$$

$u=e^{kx}-e^{-kx}$ යැයි ගනිමු. (5)

එවිට $\frac{du}{dx}=k\left(e^{kx}+e^{-kx}\right)$ වේ.

$x=\frac{1}{k}$ සඳහා $u=e-\frac{1}{e}$.

$x=0$ සඳහා $u=0$.

$[f(x)]^n f'(x)$

$\frac{\left(e^{kx}-e^{-kx}\right)^5}{5k}$ එකවර ලියා තිබේනම් 15 ම දෙන්න.

7. $t \in \mathbb{R}$ සඳහා $x = e^t - 2e^{-t}$ හා $y = 2e^t + e^{-t}$ මගින් පරාමිතිකව දෙනු ලබන වක්‍රය $C$ යැයි ගනිමු. $\dfrac{dy}{dx} = \dfrac{2e^{2t}-1}{e^{2t}+2}$ බව පෙන්වන්න.
$C$ වක්‍රයට එය මත $x = 1$ ට අනුරූප ලක්ෂ්‍යයේදී වූ ස්පර්ශකයේ අනුක්‍රමණය සොයන්න.

$x = e^t - 2e^{-t}$ හා $y = 2e^t + e^{-t}$.

$\dfrac{dx}{dt} = e^t + 2e^{-t}$ හා $\dfrac{dy}{dt} = 2e^t - e^{-t}$. (5)

දැන්, $\dfrac{dy}{dx} = \dfrac{\frac{dy}{dt}}{\frac{dx}{dt}} = \dfrac{2e^t - e^{-t}}{e^t + 2e^{-t}}$

$= \dfrac{2e^{2t}-1}{e^{2t}+2}$. (5)

$x = 1$ විට $1 = e^t - 2e^{-t}$ වේ. (5)

එනම් $e^{2t} - e^t - 2 = 0$ වේ.

$\therefore (e^t+1)(e^t-2) = 0$

$\therefore e^t = 2 \quad (\because e^t + 1 > 0)$ (5)

$\therefore t = \ln 2$.

$\left.\dfrac{dy}{dx}\right|_{t=\ln 2} = \dfrac{2\times 2^2 - 1}{2^2+2} = \dfrac{7}{6}$. (5)

$\therefore$ අවශ්‍ය අනුක්‍රමණය $= \dfrac{7}{6}$.

8. $P \equiv (2, \alpha)$ හා $Q \equiv (1, \beta)$ යැයි ගනිමු; මෙහි $\alpha, \beta \in \mathbb{R}$ වේ. $P$ ලක්ෂ්‍යය $l_1$: $2x - y - 1 = 0$ රේඛාව මත . $Q$ ලක්ෂ්‍යය, $l_1$ රේඛාවට සමාන්තර වූ $l_2$ සරල රේඛාව මත ද පිහිටා ඇත්තේ $PQ$ හා $l_2$ අතර සුළු කෝණ $\frac{\pi}{4}$ වන පරිදි ය. $\alpha$ හා $\beta$ හි අගයන් සොයන්න.




$P = (2, \alpha)$ ලක්ෂ්‍යය $l_1$ මත බැවින් $4 - \alpha - 1 = 0$ වේ.

$\therefore \alpha = 3.$ (5)

$PQ$ හි බෑවුම $= \alpha - \beta$.

$l_1$ හා $l_2$ සමාන්තර බැවින් $l_2$ හි බෑවුම $= 2$ වේ.

දෙකටම (5)

$PQ$ හා $l_2$ අතර සුළු කෝණය $\frac{\pi}{4}$ බැවින්,

$$\left|\frac{\alpha - \beta - 2}{1 + 2(\alpha - \beta)}\right| = \tan\frac{\pi}{4} = 1 \text{ වේ.}$$ (5)

$$\therefore |1 - \beta| = |7 - 2\beta|$$

$$\therefore 1 - \beta = 7 - 2\beta \text{ හෝ } 1 - \beta = -7 + 2\beta$$

$$\therefore \beta = 6 \quad \text{හෝ} \quad \beta = \frac{8}{3}.$$

(5) (5)

**9.** අරය ඒකක 4 ක් වන, කේන්ද්‍ර $4x-3y=0$ රේඛාව මත පිහිටන හා $x^2+y^2=1$ වෘත්තය බාහිරව ස්පර්ශ කරන වෘත්තවල සමීකරණ සොයන්න.

අවශ්‍ය වෘත්තයේ කේන්ද්‍රය $(a,b)$ යැයි ගනිමු.

එහි අරය $=4$.

මෙම කේන්ද්‍රය $4x-3y=0$ මත බැවින් $4a-3b=0$ වේ. (5)

$$\therefore b=\frac{4a}{3}.$$

මෙම වෘත්තය, $x^2+y^2=1$ වෘත්තය බාහිරව ස්පර්ශ කරන බැවින්,

කේන්ද්‍ර අතර දුර = අරයයන්ගේ එකතුව විය යුතු ය. --------- (1)

$x^2+y^2=1$ වෘත්තයෙහි කේන්ද්‍රය $(0,0)$ හා එහි අරය 1 වේ. (5)

දැන් (1) න් $\sqrt{a^2+b^2}=4+1$ අපට ලැබේ. (5)

$$\therefore a^2+\left(\frac{4a}{3}\right)^2=5^2$$

$\therefore a^2=9$ හා එබැවින් $a=\pm 3$ වේ. (5)

$a=3$ විට $b=4$, හා $a=-3$ විට $b=-4$ වේ.

පිළිතුර : $(x-3)^2+(y-4)^2=16$, $(x+3)^2+(y+4)^2=16$ (5)

$x^2-6x+9+y^2-8y+16=16$
$x^2+y^2-6x-8y+9=0$

$x^2+6x+9+y^2+8y+16=16$
$x^2+y^2+6x+8y+9=0$

**10.** $\sin\theta - \sqrt{3}\cos\theta$ යන්න $R\sin(\theta - \alpha)$ ආකාරයෙන් ප්‍රකාශ කරන්න; මෙහි $R > 0$ හා $0 < \alpha < \frac{\pi}{2}$ වේ.
ඒ නයින්, $\sin\theta - \sqrt{3}\cos\theta$ ට එහි අවම අගය තිබෙන පරිදි වූ $\theta$ හි අගයන් සොයන්න.

$$\sin\theta - \sqrt{3}\cos\theta = 2\left\{\frac{1}{2}\sin\theta - \frac{\sqrt{3}}{2}\cos\theta\right\} \quad (5)$$

$$= 2\left\{\cos\frac{\pi}{3}\sin\theta - \sin\frac{\pi}{3}\cos\theta\right\} \quad (5)$$

$$= 2\sin\left(\theta - \frac{\pi}{3}\right). \quad (5)$$

$R = 2$ හා $\alpha = \frac{\pi}{3}$.

$\sin\theta - \sqrt{3}\cos\theta$ හි අවමය $-2$ වන අතර,

එය ලැබෙන්නේ $\sin\left(\theta - \frac{\pi}{3}\right) = -1$ විටය. (5)

$$\sin\left(\theta - \frac{\pi}{3}\right) = \sin\left(-\frac{\pi}{2}\right)$$

$$\theta - \frac{\pi}{3} = n\pi + (-1)^n\left(-\frac{\pi}{2}\right); \text{ මෙහි } n \in \mathbb{Z}. \quad (5)$$

$$\theta = n\pi + \frac{\pi}{3} - (-1)^n\frac{\pi}{2}; \text{ මෙහි } n \in \mathbb{Z}.$$

## B කොටස

11. (a) $x \in \mathbb{R}$ සඳහා $f(x) = x^2 - 2kx - k^2 - 1$ යැයි ගනිමු; මෙහි $k \in \mathbb{R}$ වේ.

$f(x) = 0$ සමීකරණයට ශූන්‍ය නොවන තාත්ත්වික හා ප්‍රභින්න මූල දෙකක් ඇති බව පෙන්වන්න.

$\alpha$ හා $\beta$ යනු $f(x) = 0$ හි මූල යැයි ද, $r = \dfrac{1}{2\alpha}$ හා $s = \dfrac{1}{2\beta}$ යැයි ද ගනිමු.

$r$ හා $s$ මූල ලෙස ඇති වර්ගජ සමීකරණය $4(k^2+1)x^2 + 4kx - 1 = 0$ බව හා $|r - s| = \dfrac{\sqrt{2k^2+1}}{k^2+1}$ බව පෙන්වන්න.

$y = x^3 + 9x^2 + 3x + 1$ හා $y = x^3 + x^2 - x + 2$ හි ප්‍රස්තාරවල ඡේදන ලක්ෂ්‍ය දෙක අතර තිරස් දුර $\dfrac{\sqrt{3}}{2}$ බව **අපෝහනය** කරන්න.

(b) (i) $a \in \mathbb{R}$ යැයි ගනිමු. $(x-a)$ යන්න $p(x)$ බහුපදයක සාධකයක් නම්, $p(x) - (x-a)p'(x) = (x-a)^2 s(x)$ වන පරිදි $s(x)$ බහුපදයක් පවතින බව පෙන්වන්න; මෙහි $p'(x)$ යනු $p(x)$ හි ව්‍යුත්පන්නය වේ.

(ii) $x \in \mathbb{R}$ සඳහා $g(x) = x^3 - \lambda x^2 - 2x - (x-2)(3x^2 + \mu x - 2)$ යැයි ගනිමු; මෙහි $\lambda, \mu \in \mathbb{R}$ වේ. $(x-2)$ යන්න $g(x)$ හි සාධකයක් බව ද $(x-1)$ මගින් $g(x)$ බෙදූ විට ශේෂය $-3$ බව ද දී ඇත. $\lambda = 1$ හා $\mu = -2$ බව පෙන්වන්න.

ඉහත (i) භාවිතයෙන්, $(x-2)^2$ යන්න $g(x)$ හි සාධකයක් බව **අපෝහනය** කරන්න.

(a) $$f(x) = x^2 - 2kx - k^2 - 1$$

විවේචකය $\Delta = (-2k)^2 - 4(-k^2 - 1)$ (5)

$= 8k^2 + 4 > 0 \quad (\because k \in \mathbb{R})$

(5)

$\therefore f(x) = 0$ ට තාත්ත්වික ප්‍රභින්න මූල දෙකක් ඇත. (5)

තවද, මූලවල ගුණිතය $= -(k^2+1) \neq 0$.

(5)

$\therefore \; f(x) = 0$ හි මූල නිශ්ශුන්‍ය වේ. (5)

25

$r$ හා $s$ මූල ලෙස ඇති වර්ගජ සමීකරණය $x^2-(r+s)x+rs=0$ වේ. --------- (1)

(10)

දැන් $r+s=\dfrac{1}{2\alpha}+\dfrac{1}{2\beta}=\dfrac{\alpha+\beta}{2\alpha\beta}$. (5)

$\alpha+\beta=2k$ හා $\alpha\beta=-(k^2+1)$ වේ.

(5) (5)

$\therefore r+s=\dfrac{2k}{-2(k^2+1)}=-\dfrac{k}{(k^2+1)}$. (5)

තවද $rs=\dfrac{1}{4\alpha\beta}=-\dfrac{1}{4(k^2+1)}$. (5)

$\therefore$ (1), $x^2+\dfrac{k}{(k^2+1)}x-\dfrac{1}{4(k^2+1)}=0$ බවට පත්වේ.

එනම් $4(k^2+1)x^2+4kx-1=0$.

$|r-s|=\left|\dfrac{1}{2\alpha}-\dfrac{1}{2\beta}\right|=\dfrac{|\alpha-\beta|}{2|\alpha\beta|}$. --------- (2) (5)

$(\alpha-\beta)^2=(\alpha+\beta)^2-4\alpha\beta$

$=(2k)^2+4(k^2+1)$ (5)

$=8k^2+4$.

$\therefore|\alpha-\beta|=2\sqrt{2k^2+1}$. (5)

(2) $\Rightarrow|r-s|=\dfrac{2\sqrt{2k^2+1}}{2(k^2+1)}=\dfrac{\sqrt{2k^2+1}}{(k^2+1)}$. (5)

---

ඡේදන ලක්ෂ්‍යයන්හි $x-$ ඛණ්ඩාංක

$x^3+9x^2+3x+1=x^3+x^2-x+2$ හි විසඳුම් වේ. (5)

මෙයින් අපට $8x^2+4x-1=0$ ලැබේ.

මෙය $k=1$ විට $4(k^2+1)x^2+4kx-1=0$ ම වේ. (5)

$\therefore$ අවශ්‍ය දුර $=|r-s|$; මෙහි $k=1$ වේ.

$=\dfrac{\sqrt{2+1}}{1+1}=\dfrac{\sqrt{3}}{2}$. (5)

---

(*b*) (i) $(x-a)$ යනු $p(x)$ හි සාධකයක් යැයි ගනිමු.

එවිට $p(x)=(x-a)\,q(x)$ ; මෙහි $q(x)$ යනු බහුපදයකි. (5)

$\therefore p'(x)=q(x)+(x-a)q'(x)$. (5)

ඒ නයින්, $p(x)-(x-a)p'(x)=p(x)-(x-a)q(x)-(x-a)^2q'(x)$

$=-(x-a)^2q'(x)$ (5)

$=(x-a)^2s(x)$ ; මෙහි $s(x)=-q'(x)$ යනු බහුපදයකි.

(5)

**20**

---

(ii) $g(2)=0\Rightarrow 8-4\lambda-4=0\Rightarrow\lambda=1$. (5)

(5)

$g(1)=-3\Rightarrow 1-\lambda-2+3+\mu-2=-3\Rightarrow\mu=-2$ (5)

(5)

**20**

---

$p(x)=x^3-x^2-2x$ ලෙස ගන්න. එවිට $p'(x)=3x^2-2x-2$ වේ.

(5)

$\therefore g(x)=p(x)-(x-2)p'(x)$. (5)

(i) න්, $g(x)=(x-2)^2q(x)$ ; මෙහි $q(x)$ යනු බහුපදයකි.

$\therefore (x-2)^2$ යන්න $g(x)$ හි සාධකයක් වේ. (5)

**15**

---

<u>වෙනත් ක්‍රමයක්</u>

(i) න්, $g(x)-(x-2)g'(x)=(x-2)^2s(x)$ ; මෙහි $s(x)$ බහුපදයකි. (5)

$\therefore g(x)-(x-2)\left[3x^2-2x-2-(x-2)(6x-2)-(3x^2-2x-2)\right]=(x-2)^2s(x)$

(5)

$\therefore g(x)=(x-2)^2(s(x)+6x-2)$

$\Rightarrow (x-2)^2$ is a factor of $g(x)$ (5)

**15**

---

**12. (a)** එකිනෙකින් වෙනස් පොත් පහක්, $A$, $B$ හා $C$ යන සිසුන් තිදෙනෙකු අතරේ බෙදා දිය යුතුව ඇත.

(i) $A$ ට හරියටම පොත් 2 කුත්, $B$ ට හරියටම පොත් 2 කුත් හා $C$ ට හරියටම 1 පොතකුත්,

(ii) එක් එක් සිසුවාට අවම වශයෙන් 1 පොතක්

ලැබිය හැකි වෙනස් විධි ගණන සොයන්න.

**(b)** $r \in \mathbb{Z}^+$ සඳහා $U_r = \dfrac{7r+4}{r(r+1)(r+2)}$, $f(r) = \dfrac{A}{r}$ හා $g(r) = \dfrac{B}{r+1}$ යැයි ගනිමු; මෙහි $A$ හා $B$ තාත්
නියත වේ.

$r \in \mathbb{Z}^+$ සඳහා $U_r = [f(r) - f(r+2)] + [g(r) - g(r+1)]$ වන පරිදි $A$ හා $B$ හි අගයන් සොයන්න.

ඒ නයින්, $n \in \mathbb{Z}^+$ සඳහා $\sum_{r=1}^{n} U_r = \dfrac{9}{2} - \dfrac{2}{n+1} - \dfrac{5}{n+2}$ බව පෙන්වන්න.

තවද, $\sum_{r=1}^{\infty} U_r$ අපරිමිත ශ්‍රේණිය අභිසාරී බව පෙන්වා එහි ඓක්‍යය සොයන්න.

$\lim_{n\to\infty}\left(\sum_{r=1}^{2n} U_r + m\sum_{r=1}^{n-1} U_{n-r}\right) = 18$ වන පරිදි $m$ තාත්ත්වික නියතයෙහි අගය සොයන්න.

---

(a) (i)

| A | B | C |
|---|---|---|
| 2 | 2 | 1 |

පිළිතුර $= {}^5C_2 \times {}^3C_2 \times {}^1C_1$ (5)

(5) (5) (5)

$= \dfrac{5!}{2!3!} \times 3 \times 1 = 10 \times 3 = 30$ (5)

25

(ii)

| A | B | C | වෙනස් ආකාර ගණන |
|---|---|---|---|
| 2 | 2 | 1 | ${}^5C_2 \times {}^3C_2 \times {}^1C_1 = 30$ (5) |
| 2 | 1 | 2 | ${}^5C_2 \times {}^3C_1 \times {}^2C_2 = 30$ (5) |
| 1 | 2 | 2 | ${}^5C_1 \times {}^4C_2 \times {}^2C_2 = 30$ (5) |
| 3 | 1 | 1 | ${}^5C_3 \times {}^2C_1 \times {}^1C_1 = 20$ (5) |
| 1 | 3 | 1 | ${}^5C_1 \times {}^4C_3 \times {}^1C_1 = 20$ (5) |
| 1 | 1 | 3 | ${}^5C_1 \times {}^4C_1 \times {}^3C_3 = 20$ (5) |

30×3 + 20×3

150

මුළු වෙනස් ආකාර ගණන $= 90 + 60 = 150$. (5)

**35**

---

(b) $u_r = \dfrac{7r+4}{r(r+1)(r+2)},\ f(r) = \dfrac{A}{r},\ g(r) = \dfrac{B}{r+1}.$

$$u_r = \left[f(r) - f(r+2)\right] + \left[g(r) - g(r+1)\right]$$

$$\Leftrightarrow \frac{7r+4}{r(r+1)(r+2)} = \left(\frac{A}{r} - \frac{A}{r+2}\right) + \left(\frac{B}{r+1} - \frac{B}{r+2}\right) \quad (10)$$

$$\Leftrightarrow\ 7r+4 = A(r+1)(r+2) - (A+B)r(r+1) + Br(r+2)$$

$$\Leftrightarrow\ 7r+4 = (2A+B)r + 2A \quad \text{for } r \in \mathbb{Z}^+. \quad (5)$$

$$\Leftrightarrow 2A + B = 7 \text{ and } 2A = 4$$

$$\Leftrightarrow\ A = 2 \text{ and } B = 3$$

(5) (5)

**25**

---

$$\therefore f(r)=\frac{2}{r} \quad \text{හා} \quad g(r)=\frac{3}{r+1}.$$

දැන්,
$$U_1 = f(1)-f(3)+g(1)-g(2)$$
$$U_2 = f(2)-f(4)+g(2)-g(3) \quad (10)$$
$$U_3 = f(3)-f(5)+g(3)-g(4)$$

• • • • •

• • • • •

• • • • •

$$U_{n-2} = f(n-2)-f(n)+g(n-2)-g(n-1)$$
$$U_{n-1} = f(n-1)-f(n+1)+g(n-1)-g(n) \quad (10)$$
$$U_n = f(n)-f(n+2)+g(n)-g(n+1)$$

$$\therefore \sum_{r=1}^{n} u_r = f(1)+f(2)-f(n+1)-f(n+2)+g(1)-g(n+1) \quad (10)$$

$$=\frac{2}{1}+\frac{2}{2}-\frac{2}{n+1}-\frac{2}{n+2}+\frac{3}{2}-\frac{3}{n+2} \quad (5)$$

$$=\frac{9}{2}-\frac{2}{n+1}-\frac{5}{n+2}. \quad (5)$$

**40**

---

$$\therefore \lim_{n\to\infty}\sum_{r=1}^{n} u_r = \lim_{n\to\infty}\left(\frac{9}{2}-\frac{2}{n+1}-\frac{5}{n+2}\right)$$

(5)

$$=\frac{9}{2}. \quad (5)$$

$\therefore \sum_{r=1}^{\infty} u_r$ අභිසාරී වන අතර එහි ඓක්‍යය $\frac{9}{2}$ වේ. (5)

**15**

---

$$\lim_{n\to\infty}\left(\sum_{r=1}^{2n} u_r + m\sum_{r=1}^{n-1} u_{n-r}\right)=18$$

$$\Leftrightarrow \lim_{n\to\infty}\sum_{r=1}^{2n} u_n + m\lim_{n\to\infty}\sum_{r=1}^{n-1} u_r = 18$$

(5)

$$\Leftrightarrow \quad \frac{9}{2}+m\times\frac{9}{2}=18$$

$$\Leftrightarrow \quad m=3. \quad (5)$$

**10**

---

**13.** (*a*) $\mathbf{A} = \begin{pmatrix} 2 & a \\ 3 & 1 \end{pmatrix}$, $\mathbf{B} = \begin{pmatrix} 2 & 1 & a \\ 1 & 4 & 1 \end{pmatrix}$ හා $\mathbf{C} = \begin{pmatrix} 4+a & 7 \\ 6 & 7 \\ 3a & 4 \end{pmatrix}$ යැයි ගනිමු; මෙහි $a \in \mathbb{R}$ වේ.

$\mathbf{A}^{-1}$ පවතින පරිදි $a$ හි අගයන් සොයන්න.

$a$ ඇසුරෙන් $\mathbf{AB}$ සොයන්න.

$\mathbf{B}^{\mathrm{T}}\mathbf{A}^{\mathrm{T}} = \mathbf{C}$ වන පරිදි $a$ හි අගය නිර්ණය කරන්න.

$a$ හි මෙම අගය සඳහා, $\mathbf{A} - \mathbf{A}^{-1} = 3\mathbf{I}$ බව පෙන්වන්න; මෙහි $\mathbf{I}$ යනු ගණය 2 වූ ඒකක න්‍යාසය වේ.

(*b*) $w = -\dfrac{\sqrt{2}(3+i)}{(1+2i)}$ යැයි ගනිමු. $|w| = 2$ හා $\operatorname{Arg} w = \dfrac{3\pi}{4}$ බව පෙන්වන්න.

$|z| = 2$ හා $\operatorname{Arg} z = \dfrac{\pi}{3}$ වන පරිදි $z \in \mathbb{C}$ යැයි ගනිමු.

තවද, ආගන්ඩ් සටහනක් මත $A$ හා $B$ යනු, පිළිවෙළින් $z$ හා $w$ සංකීර්ණ සංඛ්‍යා නිරූපණය කරන ලක්ෂ්‍ය යැයි ගනිමු. $AB^2 = 8 + 2\sqrt{2} - 2\sqrt{6}$ බව පෙන්වන්න.

$AB$ හි මධ්‍ය ලක්ෂ්‍යය $C$ යැයි ගනිමු. $AOC$ ත්‍රිකෝණය භාවිතයෙන් $\sin^2\left(\dfrac{5\pi}{24}\right) = \dfrac{1}{8}\left(4 + \sqrt{2} - \sqrt{6}\right)$ බව අපෝහනය කරන්න; මෙහි $O$ මූල ලක්ෂ්‍යය වේ.

(*c*) $m \in \mathbb{Z}^+$ යැයි ගනිමු. $(1 + \sqrt{3}\,i)^{3m}(1 + i)^8 = 2^{3m+4}$ බව දී ඇත.

$m$ හි අඩුතම අගය සොයන්න.

(*a*) $\mathrm{A}^{-1}$ පවතී $\Leftrightarrow |\mathrm{A}| \neq 0$ (5)

$\Leftrightarrow 2 - 3a \neq 0$

$\Leftrightarrow a \neq \dfrac{2}{3}.$ (5)

**10**

---

$$\mathrm{AB} = \begin{pmatrix} 2 & a \\ 3 & 1 \end{pmatrix}\begin{pmatrix} 2 & 1 & a \\ 1 & 4 & 1 \end{pmatrix}$$

$$= \begin{pmatrix} 4+a & 2+4a & 3a \\ 7 & 7 & 3a+1 \end{pmatrix}$$ (10) 10

**10**

---

$$\mathrm{B^T A^T = C}$$

$$\Leftrightarrow \quad \mathrm{(AB)^T = C}$$

$$\begin{pmatrix} 4+a & 7 \\ 2+4a & 7 \\ 3a & 3a+1 \end{pmatrix} = \begin{pmatrix} 4+a & 7 \\ 6 & 7 \\ 3a & 4 \end{pmatrix}$$

$\Leftrightarrow 2+4a=6$ හා $3a+1=4$

$\Leftrightarrow a=1.$

---

$a=1$ සඳහා, $\mathrm{A} = \begin{pmatrix} 2 & 1 \\ 3 & 1 \end{pmatrix}.$

දැන්, $\mathrm{A^{-1}} = \dfrac{1}{(2-3)} \begin{pmatrix} 1 & -1 \\ -3 & 2 \end{pmatrix} = \begin{pmatrix} -1 & 1 \\ 3 & -2 \end{pmatrix}$

$$\therefore \mathrm{A - A^{-1}} = \begin{pmatrix} 2 & 1 \\ 3 & 1 \end{pmatrix} - \begin{pmatrix} -1 & 1 \\ 3 & -2 \end{pmatrix}$$

$$= \begin{pmatrix} 3 & 0 \\ 0 & 3 \end{pmatrix} = 3 \begin{pmatrix} 1 & 0 \\ 0 & 1 \end{pmatrix} = 3\mathrm{I}$$

---

(b) $w = \dfrac{-\sqrt{2}(3+i)}{(1+2i)} \times \dfrac{(1-2i)}{(1-2i)}$

$$= \frac{-\sqrt{2}\left(3-6i+i+2\right)}{1+4}$$

$$= \frac{-\sqrt{2}}{5}(5-5i)$$

$$= -\sqrt{2}+\sqrt{2}i = 2\left(\frac{-1}{\sqrt{2}} + \frac{1}{\sqrt{2}}i\right) = 2\left(\cos\frac{3\pi}{4} + i\sin\frac{3\pi}{4}\right).$$

$\therefore |w| = 2$ හා $\operatorname{Arg} w = \dfrac{3\pi}{4}.$

---




$$z = 2\left(\cos\frac{\pi}{3} + i\sin\frac{\pi}{3}\right)$$ (5)

$$= 1 + \sqrt{3}i$$ (5)

$$w = -\sqrt{2} + \sqrt{2}i$$

$$AB^2 = |z-w|^2 = \left(1+\sqrt{2}\right)^2 + \left(\sqrt{3}-\sqrt{2}\right)^2$$ (5)

(5)

$$= 1 + 2\sqrt{2} + 2 + 3 - 2\sqrt{6} + 2$$

$$= 8 + 2\sqrt{2} - 2\sqrt{6}.$$ (5)

**25**

---

$$O\hat{C}A = \frac{\pi}{2},\ A\hat{O}C = \frac{1}{2}\left(\frac{3\pi}{4} - \frac{\pi}{3}\right) = \frac{5\pi}{24}$$ (5)

$$\sin^2\frac{5\pi}{24} = \frac{AC^2}{OA^2}$$ (5)

$$= \frac{\left(\frac{AB}{2}\right)^2}{2^2} = \frac{1}{16}.\ \left(8 + 2\sqrt{2} - 2\sqrt{6}\right)$$

$$= \frac{1}{8}\left(4 + \sqrt{2} - \sqrt{6}\right).$$ (5)

**15**

---

(c) $\left(1+\sqrt{3}i\right)^{3m}\left(1+i\right)^8 = 2^{3m+4}$ ---------- (1)

$$1 + \sqrt{3}i = 2\left(\cos\frac{\pi}{3} + i\sin\frac{\pi}{3}\right)$$ (5)

$$1 + i = \sqrt{2}\left(\cos\frac{\pi}{4} + i\sin\frac{\pi}{4}\right)$$ (5)

ද මුවාවර් ප්‍රමේයය භාවිතයෙන්,

$$(1) \Leftrightarrow 2^{3m}\left(\cos m\pi + i\sin m\pi\right).2^4.\left(\cos 2\pi + i\sin 2\pi\right) = 2^{3m+4}$$ (5)+(5)

$$\Leftrightarrow \cos m\pi + i\sin m\pi = 1$$

$$\Leftrightarrow \cos m\pi = 1$$

$$\Leftrightarrow m\pi = 2n\pi \qquad n \in Z.$$

$m$ හි අඩුතම අගය $= 2$ $\quad (\because m \in Z^+)$. (5)

**25**

---

**14.** (*a*) $x \in \mathbb{R} - \{1\}$ සඳහා, $f(x) = \dfrac{x^2 + x + p}{(x-1)^2}$ යැයි ගනිමු; මෙහි $p \in \mathbb{R}$ වේ. $y = f(x)$ හි ප්‍රස්තාරය, $x$-ඛණ්ඩාං

$-\dfrac{1}{3}$ වන ලක්ෂ්‍යයකදී, එහි තිරස් ස්පර්ශෝන්මුඛය ඡේදනය කරන බව දී ඇත. $p = 2$ බව පෙන්වන්

$f(x)$ හි ව්‍යුත්පන්නය $f'(x)$ යන්න $x \in \mathbb{R} - \{1\}$ සඳහා $f'(x) = -\dfrac{(3x+5)}{(x-1)^3}$ මගින් දෙනු ලබන බව පෙන්

**ඒ නයින්**, $f(x)$ වැඩි වන ප්‍රාන්තර හා $f(x)$ අඩුවන ප්‍රාන්තර සොයන්න.

$y = f(x)$ හි ප්‍රස්තාරයෙහි හැරුම් ලක්ෂ්‍යයෙහි ඛණ්ඩාංක ද සොයන්න.

$f(x)$ හි දෙවන ව්‍යුත්පන්නය $f''(x)$ යන්න $\mathbb{R} - \{1\}$ සඳහා $f''(x) = \dfrac{6(x+3)}{(x-1)^4}$ මගින් දෙනු ලබන බව දී

$y = f(x)$ හි ප්‍රස්තාරයට $(-3, \dfrac{1}{2})$ හිදී නතිවර්තන ලක්ෂ්‍යයක් ඇති බව පෙන්වන්න.

හැරුම් ලක්ෂ්‍යය, ස්පර්ශෝන්මුඛ හා නතිවර්තන ලක්ෂ්‍යය දක්වමින් $y = f(x)$ හි ප්‍රස්තාරයේ දළ සට

අඳින්න.

(*b*) රූපයේ පෙන්වා ඇති පරිදි, අරය 3 cm ක් වූ ගෝලයක සෘජු වෘත්තාකාර කේතුවක් අන්තර්ගත කළ යුතුව ඇත.




කේතුවේ උස $h$ cm යැයි ගනිමු. කේතුවේ පරිමාව $V$ cm³ යන්න $V = \dfrac{\pi}{3}\left(6h^2 - h^3\right)$ මගින් දෙනු ලබන බව පෙන්වන්න.

තවද, ගෝලය තුළ අන්තර්ගත කළ හැකි විශාලතම එබඳු කේතුව ලැබෙන්නේ $h = 4$ වන විට බව පෙන්වන්න.

(*a*) $f(x) = \dfrac{x^2 + x + p}{(x-1)^2}$ ; $x \neq 1$.

$\lim_{x \to \pm\infty} f(x) = 1.$ (5)

$\therefore$ තිරස් ස්පර්ශෝන්මුඛය $y = 1$ වේ. (5)

$f\left(-\dfrac{1}{3}\right) = 1$ බව දී ඇත. (5)

එවිට $\dfrac{\dfrac{1}{9} - \dfrac{1}{3} + p}{\left(-\dfrac{4}{3}\right)^2} = 1$ (5)

$\therefore p - \dfrac{2}{9} = \dfrac{16}{9}$

$\therefore p = 2.$ (5)

$$f(x)=\frac{x^2+x+2}{(x-1)^2}$$

$$\therefore f'(x)=\frac{(x-1)^2(2x+1)-(x^2+x+2)2(x-1)}{(x-1)^4} \quad (10)$$

$$=\frac{(x-1)(2x+1)-2(x^2+x+2)}{(x-1)^3}$$

$$=\frac{2x^2-x-1-2x^2-2x-4}{(x-1)^3}$$

$$=-\frac{(3x+5)}{(x-1)^3};\ x\neq 1 \text{ සඳහා} \quad (5)$$

**15**

---

$$f'(x)=0 \Leftrightarrow x=\frac{-5}{3}. \quad (5)$$

| | $-\infty<x<\frac{-5}{3}$ | $-\frac{5}{3}<x<1$ | $1<x<\infty$ |
|---|---|---|---|
| $f'(x)$ හි ලකුණ | $(-)$ | $(+)$ | $(-)$ |
| $f(x)$ | අඩු වේ. | වැඩි වේ. | අඩු වේ. |

(10) 3 ම සඳහා
(5) ඕනෑම 2 ක් සඳහා

(10) 3 ම සඳහා
(5) ඕනෑම 2 ක් සඳහා

$f(x)$ යන්න $\left(-\infty,-\frac{5}{3}\right]$ මත හා $(1,\infty)$ මත අඩු වේ.

$f(x)$ යන්න $\left[-\frac{5}{3},1\right)$ මත වැඩි වේ.

**25**

---

$$f\left(-\frac{5}{3}\right)=\frac{\left(\frac{-5}{3}\right)^2-\frac{5}{3}+2}{\left(\frac{-5}{3}-1\right)^2}=\frac{\frac{25}{9}-\frac{5}{3}+2}{\frac{64}{9}}=\frac{28}{64}=\frac{7}{16}. \quad (5)$$

(5)

හැරවුම් ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක $=\left(-\frac{5}{3},\frac{7}{16}\right)$. (5)

**15**

---

$f''(x) = \dfrac{6(x+3)}{(x-1)^4}$; $x \neq 1$ සඳහා

$f''(x) = 0 \Leftrightarrow x = -3.$ (5)

| | $-\infty < x < -3$ | $-3 < x < 1$ |
|---|---|---|
| $f''(x)$ හි ලකුණ | $(-)$ | $(+)$ |
| අවකලතාව | යටි අවතල | උඩු අවතල |

(5) + (5)

(5) දෙකම සඳ...

$f(-3) = \dfrac{9-3+2}{16} = \dfrac{1}{2}.$ (5)

$\therefore\ y = f(x)$ හි ප්‍රස්ථාරයට $\left(-3, \dfrac{1}{2}\right)$ හිදී නතිවර්තන ලක්ෂ්‍යයක් ඇත.

85

---

$\lim\limits_{x \to 1^+} f(x) = \infty$

$\lim\limits_{x \to 1^-} f(x) = \infty$




15

---

(*b*) කේතුවේ පතුලේ අරය




$= \sqrt{3^2 - (h-3)^2}$ (5)

$= \sqrt{6h - h^2}$

$V = \frac{1}{3}\pi\left(6h - h^2\right) \times h$

$= \frac{\pi}{3}\left(6h^2 - h^3\right)$ ; $h > 0.$ (5)

**10**

---

$\frac{dV}{dh} = \frac{\pi}{3}(12h - 3h^2) = \pi(4-h)h$ (5)

$\frac{dV}{dh} = 0 \Leftrightarrow h = 4$ $(\because h > 0)$ (5) (5)

$\frac{dV}{dh} > 0$, $0 < h < 4$ විට

$\frac{dV}{dh} < 0, h > 4$ විට.




$\therefore V$ උපරිම වන්නේ $h = 4$ විටය. (5)

**20**

---

**15.** (a) $k \in \mathbb{R}$ යැයි ගනිමු. $\int \frac{\sqrt{x}}{(1-k^2x)}\,dx$ සොයන්න.

(b) $0 < x < \frac{\pi}{4}$ සඳහා $\frac{d}{dx}\left\{\ln\left(\frac{1+\sin 2x}{\cos 2x}\right)\right\} = \frac{2}{\cos 2x}$ බව පෙන්වන්න.

කොටස් වශයෙන් අනුකලනය භාවිතයෙන්, $\int (\cos 2x)\ln\left(\frac{1+\sin 2x}{\cos 2x}\right)dx$ සොයන්න.

(c) $a$ නියතයක් වන $\int_0^a f(x)\,dx = \int_0^a f(a-x)\,dx$ සූත්‍රය භාවිතයෙන්,

$$\int_0^{\frac{\pi}{6}} \frac{\cos(x+\frac{\pi}{3})}{\sin x + \cos(x+\frac{\pi}{3})}\,dx = \int_0^{\frac{\pi}{6}} \frac{\sin x}{\sin x + \cos(x+\frac{\pi}{3})}\,dx$$ බව පෙන්වන්න.

$$\int_0^{\frac{\pi}{6}} \frac{\cos(x+\frac{\pi}{3})}{\sin x + \cos(x+\frac{\pi}{3})}\,dx = \frac{\pi}{12}$$ බව අපෝහනය කරන්න.

(a) (i) අවස්ථාව : $k \neq 0$

$\int \frac{\sqrt{x}}{(1-k^2x)}\,dx$ $\qquad u = \sqrt{x}$ යැයි ගනිමු. (5)

$= \int \frac{u}{(1-k^2u^2)} 2u\,du$ (5) $\qquad$ එවිට $\frac{du}{dx} = \frac{1}{2\sqrt{x}}$. හා $dx = 2\sqrt{x}\,du$. (5)

$= 2\int \frac{u^2}{(1-k^2u^2)}\,du$

$= \frac{2}{-k^2}\int \frac{1-k^2u^2-1}{(1-k^2u^2)}\,du$ (5)

$= \frac{-2}{k^2}\int \left\{1 - \frac{1}{(1-ku)(1+ku)}\right\}du$ (5)

$= \frac{-2}{k^2}\int \left\{1 - \frac{\frac{1}{2}}{1-ku} - \frac{\frac{1}{2}}{1+ku}\right\}du$ (5) + (5)

$= \frac{-2}{k^2}\left\{u + \frac{1}{2k}\ln|1-ku| - \frac{1}{2k}\ln|1+ku|\right\} + C$; මෙහි $C$ යනු අභිමත නියතයකි. (5)

(5) (5)

$= \frac{-2}{k^2}\left\{\sqrt{x} + \frac{1}{2k}\ln\left|1-k\sqrt{x}\right| - \frac{1}{2k}\ln\left|1+k\sqrt{x}\right|\right\} + C.$ (5)

(ii) අවස්ථාව: $k = 0$

$$\int \frac{\sqrt{x}}{1-k^2x}dx = \int \sqrt{x}\, dx \quad (5)$$

$$= \frac{2}{3}x^{\frac{3}{2}} + C_1 \text{; මෙහි } C_1 \text{ යනු අභිමත නියතයකි.} \quad (5)$$

**65**

---

(*b*) $$\frac{d}{dx}\left\{\ln\left(\frac{1+\sin 2x}{\cos 2x}\right)\right\} = \frac{\cos 2x}{(1+\sin 2x)}\cdot\frac{\cos 2x(2\cos 2x)+(1+\sin 2x)2\sin 2x}{\cos^2 2x} \quad (10)$$

$$= \frac{2(\cos^2 2x + \sin 2x + \sin^2 2x)}{(1+\sin 2x)\cos 2x}$$

$$= \frac{2(1+\sin 2x)}{(1+\sin 2x)\cos 2x} \quad (5)$$

$$= \frac{2}{\cos 2x}. \quad (5)$$

**20**

---

$$\int (\cos 2x)\ln\left(\frac{1+\sin 2x}{\cos 2x}\right)dx$$

$$= \frac{\sin 2x}{2}\ln\left(\frac{1+\sin 2x}{\cos 2x}\right) - \int \frac{\sin 2x}{2}\cdot\frac{2}{\cos 2x}dx \quad (10)$$

$$= \frac{1}{2}\sin 2x.\ln\left(\frac{1+\sin 2x}{\cos 2x}\right) + \frac{1}{2}\ln|\cos 2x| + C \text{; මෙහි } C \text{ යනු අභිමත නියතයකි.} \quad (10)$$

**20**

---

(c) $I = \int_0^{\frac{\pi}{6}} \frac{\cos\left(x+\frac{\pi}{3}\right)}{\sin x+\cos\left(x+\frac{\pi}{3}\right)} dx = \int_0^{\frac{\pi}{6}} \frac{\cos\left(\frac{\pi}{6}-x+\frac{\pi}{3}\right)}{\sin\left(\frac{\pi}{6}-x\right)+\cos\left(\frac{\pi}{6}-x+\frac{\pi}{3}\right)} dx$ (10)

$$= \int_0^{\frac{\pi}{6}} \frac{\cos\left(\frac{\pi}{2}-x\right)}{\sin\left(\frac{\pi}{6}-x\right)+\cos\left(\frac{\pi}{2}-x\right)} dx$$ (5)

$$= \int_0^{\frac{\pi}{6}} \frac{\sin x}{\cos\left(\frac{\pi}{2}-\frac{\pi}{6}+x\right)+\sin x} dx$$ (5)

$$I = \int_0^{\frac{\pi}{6}} \frac{\sin x}{\sin x+\cos\left(x+\frac{\pi}{3}\right)} dx$$ (5)

---

$$\therefore \int_0^{\frac{\pi}{6}} \frac{\cos\left(x+\frac{\pi}{3}\right)}{\sin x+\cos\left(x+\frac{\pi}{3}\right)} dx = \frac{1}{2}\int_0^{\frac{\pi}{6}} \frac{\cos\left(x+\frac{\pi}{3}\right)+\sin x}{\sin x+\cos\left(x+\frac{\pi}{3}\right)} dx$$ (10)

$$= \frac{1}{2}\int_0^{\frac{\pi}{6}} 1\, dx$$ (5)

$$= \frac{1}{2}\cdot x\Big|_0^{\frac{\pi}{6}}$$

$$= \frac{\pi}{12}$$ (5)

---

16. $O$ මූල ලක්ෂ්‍යය ද, $A \equiv (1, 2)$ හා $B \equiv \left(\frac{5}{2}, \frac{5}{4}\right)$ යැයි ද ගනිමු. $A\hat{O}B$ හා $O\hat{A}B$ කෝණවල කෝණ සමච්ඡේදකවල සමීකරණ සොයා, මෙම කෝණ සමච්ඡේදක $D \equiv \left(\frac{5}{4}, \frac{5}{4}\right)$ ලක්ෂ්‍යයේදී ඡේදනය වන බව පෙන්වන්න.

$D$ සිට $OA$ රේඛාවට ලම්බ දුර සොයන්න.

$OAB$ ත්‍රිකෝණයේ පාද තුනම ස්පර්ශ කරන $C_1$ වෘත්තයේ සමීකරණය ලියා දක්වන්න.

$C_1$ වෘත්තය, $OA$ හා $AB$ ස්පර්ශ කරන ලක්ෂ්‍ය පිළිවෙළින් $E$ හා $F$ යැයි සිතමු. $A, E$ හා $F$ ලක්ෂ්‍ය හරහා යන $C_2$ වෘත්තයේ සමීකරණය $4x^2 + 4y^2 - 9x - 13y + 15 = 0$ මගින් දෙනු ලබන බව පෙන්වන්න.

$C_1$ හා $C_2$ වෘත්තයන්හි ඡේදනය ප්‍රලම්බ දැයි නිර්ණය කරන්න.




$OA$ හි සමීකරණය : $y = 2x$ (5)

$OB$ හි සමීකරණය : $2y = x$ (5).

$A\hat{O}B$ හි කෝණ සමච්ඡේදකය සඳහා

$$\frac{|y-2x|}{\sqrt{5}} = \frac{|2y-x|}{\sqrt{5}}. \quad (10)$$

$\therefore y - 2x = \pm(2y - x)$

$\therefore y - 2x = 2y - x$ හෝ $y - 2x = -(2y - x)$

$\therefore y + x = 0$ හෝ $y - x = 0.$ (5)

$(1, 2)$ ආදේශ කරන්න : $y + x = 3 > 0$

$\left(\frac{5}{2}, \frac{5}{4}\right)$ අදේශ කරන්න : $y + x = \frac{15}{4} > 0.$

$\therefore$ $A\hat{O}B$ හි කෝණ සමච්ඡේදකය $y - x = 0$ වෙ. (5)

$AB$ හි සමීකරණය: $y - 2 = \dfrac{\left(\frac{5}{4} - 2\right)}{\left(\frac{5}{2} - 1\right)}(x - 1)$ (5)

$$y-2=-\frac{1}{2}(x-1)$$

$$2y+x-5=0 \quad (5)$$

$O\hat{A}B$ හි කෝණ සමච්ඡේදකය සඳහා

$$\frac{|2y+x-5|}{\sqrt{5}}=\frac{|y-2x|}{\sqrt{5}} \quad (10)$$

$$\therefore 2y+x-5=\pm(y-2x)$$

$$\therefore y+3x-5=0 \text{ හෝ } 3y-x-5=0. \quad (5)$$

$(0,0)$ ආදේශ කරන්න : $y+3x-5=-5<0.$

$\left(\frac{5}{2},\frac{5}{4}\right)$ ආදේශ කරන්න : $y+3x-5=\frac{5}{4}+\frac{15}{2}-5>0.$

$\therefore$ $O\hat{A}B$ කෝණයෙහි සමච්ඡේදකය $y+3x-5=0$ වේ. (5)

D සඳහා $y-x=0$ හා $y+3x-5=0$:

$$\Rightarrow x=\frac{5}{4} \quad (5) \quad \text{හා} \quad y=\frac{5}{4}. \quad (5)$$

$$\therefore D\equiv\left(\frac{5}{4},\frac{5}{4}\right).$$

---

$D$ සිට $OA$ ට ලම්බ දුර

$$\frac{\left|\frac{5}{4}-2.\frac{5}{4}\right|}{\sqrt{5}}=\frac{\sqrt{5}}{4}. \quad (10)$$

---




$C_1$ හි සමීකරණය $\left(x-\frac{5}{4}\right)^2+\left(y-\frac{5}{4}\right)^2=\frac{5}{16}$ වේ. (10)

එනම් $x^2+y^2-\frac{5}{2}x-\frac{5}{2}y+\frac{45}{16}=0$.

---

$EF$ යනු $A$ සිට $C_1$ ට වූ ස්පර්ශ ජ්‍යාය වේ.

$\therefore$ $EF$ හි සමීකරණය $xx_1 + yy_1 + g(x+x_1) + f(y+y_1) + c = 0$ වේ.

එනම් $x + 2y - \frac{5}{4}(x+1) - \frac{5}{4}(y+2) + \frac{45}{16} = 0.$ (10)

$$16x + 32y - 20x - 20 - 20y - 40 + 45 = 0$$

$$-4x + 12y - 15 = 0.$$

$$4x - 12y + 15 = 0. \quad (5)$$

$\therefore$ $C_2$ හි සමීකරණය

$$x^2 + y^2 - \frac{5}{2}x - \frac{5}{2}y + \frac{45}{16} + \lambda(4x - 12y + 15) = 0; \quad (10)$$

මෙහි $\lambda$ නිර්ණය කළ යුතුය.

$A \equiv (1,2)$ ලක්ෂ්‍යය $C_2$ මත වේ.

$$\therefore 1 + 4 - \frac{5}{2} - 5 + \frac{45}{16} + \lambda(4 - 24 + 15) = 0.$$

$$\frac{5}{16} - \lambda \times 5 = 0$$

$$\therefore \lambda = \frac{1}{16}. \quad (5)$$

$C_2$ හි සමීකරණය

$$x^2 + y^2 - \frac{5}{2}x - \frac{5}{2}y + \frac{45}{16} + \frac{4}{16}x - \frac{12}{16}y + \frac{15}{16} = 0.$$

$$16x^2 + 16y^2 - 40x - 40y + 45 + 4x - 12y + 15 = 0$$

$$16x^2 + 16y^2 - 36x - 52y + 60 = 0$$

$$4x^2 + 4y^2 - 9x - 13y + 15 = 0. \quad (10)$$

**40**

---

$E = 3/4, 3/2$

$F = 3/2, 7/4$

$C_1$ සඳහා : $g=-\frac{5}{4},\ f=-\frac{5}{4}, c=\frac{45}{16}$

$C_2$ සඳහා : $g'=-\frac{9}{8},\ f'=-\frac{13}{8}, c'=\frac{15}{4}$

$2gg'+2ff'=2\left(-\frac{5}{4}\right)\left(-\frac{9}{8}\right)+2\left(-\frac{5}{4}\right)\left(-\frac{13}{8}\right)=\frac{45}{16}+\frac{65}{16}=\frac{55}{8}$ (10)

$c+c'=\frac{45}{16}+\frac{15}{4}=\frac{105}{16}\neq 2gg'+2ff'.$ (5)

(5)

∴ ප්‍රලම්බව ඡේදනය නොවේ.

---

**17. (a)** $\sin A, \sin B, \cos A$ හා $\cos B$ ඇසුරෙන් $\sin(A+B)$ ලියා දක්වන්න.

$\sin 2\theta = 2\sin\theta\cos\theta$ බව **අපෝහනය** කරන්න.

$0 < \theta < \frac{\pi}{2}$ යැයි ගනිමු. $\cot\theta - 2\tan\theta = \sin 2\theta$ සමීකරණය $a\cos^4\theta + b\cos^2\theta + c = 0$ ආකාරයෙන් ප්‍රකාශ කරන්න; මෙහි $a, b$ හා $c$ තාත්ත්වික නියත වේ.

**ඒ නයින්**, $\theta = \cos^{-1}\sqrt{\frac{\sqrt{17}-1}{4}}$ බව පෙන්වන්න.

**(b)** තලයක් මත $A, B, C$ හා $D$ ප්‍රභින්න ලක්ෂ්‍ය පිහිටා ඇත්තේ $B\hat{A}D = A\hat{B}C = \theta$ හා $3AD = 4BC$ වන පරිදි ය.

$B\hat{A}C = \alpha$ හා $A\hat{B}D = \beta$ යැයි ගනිමු. (රූපය බලන්න.)




සයින් නීතිය භාවිතයෙන්, $\frac{BC}{AD} = \frac{\sin\alpha\sin(\theta+\beta)}{\sin\beta\sin(\theta+\alpha)}$ බව පෙන්වන්න.

$\cot\theta = 3\cot\alpha - 4\cot\beta$ බව **අපෝහනය** කරන්න.

**(c)** පහත සමගාමී සමීකරණ, $x$ හා $y$ සඳහා විසඳන්න:

$\sin^{-1}\sqrt{x} = \cos^{-1}\sqrt{y}$

$\tan(\tan^{-1}3x - \tan^{-1}2y) + \tan(\tan^{-1}3y - \tan^{-1}2x) = 1$.

---

(a) $\sin(A+B) = \sin A\cos B + \cos A\sin B.$ (5)

**05**

---

$A = B = \theta.$

$$\sin 2\theta = \sin\theta\cos\theta + \cos\theta\sin\theta$$
$$= 2\sin\theta\cos\theta \quad (5)$$

**05**

---

$0 < \theta < \frac{\pi}{2}$

$$\cot\theta - 2\tan\theta = \sin 2\theta$$

$$\Leftrightarrow \quad \frac{\cos\theta}{\sin\theta} - 2\frac{\sin\theta}{\cos\theta} = 2\sin\theta\cos\theta \quad (5)$$

$$\Leftrightarrow \quad \cos^2\theta - 2\sin^2\theta = 2\sin^2\theta\cos^2\theta \quad (5)$$

$$\Leftrightarrow \quad \cos^2\theta - 2(1-\cos^2\theta) = 2(1-\cos^2\theta)\cos^2\theta \quad (10)$$

(5) (5)

$$\Leftrightarrow \quad 2\cos^4\theta + \cos^2\theta - 2 = 0. \quad (5)$$

$a = 2,\ b = 1$ and $c = -2.$

**25**

---

$$\therefore \cos^2\theta = \frac{-1 \pm \sqrt{17}}{4}, \quad \text{නමුත් } \cos^2\theta > 0.$$ (10)

$$\therefore \cos^2\theta = \frac{\sqrt{17}-1}{4}$$ (5)

$$\cos\theta = \sqrt{\frac{\sqrt{17}-1}{4}} \quad (\because \cos\theta > 0)$$

$$\therefore \theta = \cos^{-1}\sqrt{\frac{\sqrt{17}-1}{4}}.$$ (5)

**[20]**

---

(b) $\triangle ABC$ සඳහා සයින් නීතිය :




$$\frac{BC}{\sin\alpha} = \frac{AB}{\sin(\pi-(\theta+\alpha))}$$ (10)

$$= \frac{AB}{\sin(\theta+\alpha)} \quad \text{-------(1)}$$ (5)

$\triangle ABD$ සඳහා සයින් නීතිය :

$$\frac{AD}{\sin\beta} = \frac{AB}{\sin(\pi-(\theta+\beta))}$$ (10)

$$= \frac{AB}{\sin(\theta+\beta)} \quad \text{-------(2)}$$ (5)

$$\frac{(1)}{(2)} \Rightarrow \frac{BC}{AD}\times\frac{\sin\beta}{\sin\alpha} = \frac{\sin(\theta+\beta)}{\sin(\theta+\alpha)}$$

$$\Rightarrow \frac{BC}{AD} = \frac{\sin\alpha\sin(\theta+\beta)}{\sin\beta\sin(\theta+\alpha)}$$ (10)

**[40]**

---

$$3AD = 4BC \Rightarrow \frac{BC}{AD} = \frac{3}{4}.$$

$$\therefore \quad \frac{3}{4} = \frac{\sin\alpha\sin(\theta+\beta)}{\sin\beta\sin(\theta+\alpha)}$$ (5)

$$4\sin\alpha(\sin\theta\cos\beta + \cos\theta\sin\beta) = 3\sin\beta(\sin\theta\cos\alpha + \cos\theta\sin\alpha)$$ (10)

$$\div \sin\theta\sin\alpha\sin\beta: \quad 4\cot\beta + 4\cot\theta = 3\cot\alpha + 3\cot\theta$$

$$\therefore \cot\theta = 3\cot\alpha - 4\cot\beta.$$ (5)

**[20]**

---

(c) $\sin^{-1}\sqrt{x} = \cos^{-1}\sqrt{y} = \alpha$ (say).

එවිට $\sin\alpha = \sqrt{x}$ සහ $\cos\alpha = \sqrt{y}$.

$\sin^2\alpha + \cos^2\alpha = 1$. (5)

$\Rightarrow x + y = 1$. -------(1) (5)

$\therefore y = 1 - x$

$\tan(\tan^{-1}3x - \tan^{-1}2y) + \tan(\tan^{-1}3y - \tan^{-1}2x) = 1$

$$\frac{3x-2y}{1+3x\times 2y} + \frac{3y-2x}{1+3y\times 2x} = 1$$ (10)

(1) $\Rightarrow$

$3x - 2(1-x) + 3(1-x) - 2x = 1 + 6x(1-x)$ (5)

$3x - 2 + 2x + 3 - 3x - 2x = 1 + 6x - 6x^2$

$6x(1-x) = 0$

$x = 0$ හෝ $x = 1$. (5)

$y = 1$ විට ~~$x=0$~~ හා $y = 0$ විට ~~$x=1$~~ ($\because$(1))

$\left.\begin{matrix} x=0 \\ y=1 \end{matrix}\right\}$ හෝ $\left.\begin{matrix} x=1 \\ y=0 \end{matrix}\right\}$. (5)

යුගල දෙකම සමීකරණ දෙකම තෘප්ත කරයි.

**35**

***

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2025

# 10 - සංයුක්ත ගණිතය II

## ලකුණු දීමේ පටිපාටිය

**II පත්‍රය**

| | | | | |
|---|---|---|---|---|
| A කොටස | = | 10 × 25 | = | 250 |
| B කොටස | = | 05 × 150 | = | 750 |

එකතුව $= \dfrac{1000}{10}$

**අවසන් ලකුණ = 100**

## A කොටස

1. ස්කන්ධය $m$ වූ $A$ අංශුවක් සුමට තිරස් මේසයක් මත නිශ්චලව ඇත. $u$ වේගයකින් මේසය මත චලනය වන ස්කන්ධය $2m$ වූ $B$ අංශුවක් $A$ සමග සරල ලෙස ගැටේ. $A$ හා $B$ අතර ප්‍රත්‍යාගති සංගුණකය $e$ වේ. ගැටුමට පසු $A$ අංශුවෙහි වේගය $\frac{2}{3}(1+e)u$ බව පෙන්වන්න.

ගැටුමෙහිදී $B$ මගින් $A$ මත යොදන ආවේගයෙහි විශාලත්වය $mu$ බව දී ඇත. $e=\frac{1}{2}$ බව පෙන්වන්න.




පද්ධතිය සඳහා $\underline{I} = \triangle(m\underline{V}) \rightarrow$

$$0 = mv_1 + 2mv_2 - 2mu \quad (5)$$

$$\therefore v_1 + 2v_2 = 2u \quad \text{---------} \; (1)$$

නිව්ටන්ගේ ප්‍රත්‍යාගති නියමයෙන් :

$$v_1 - v_2 = eu \quad \text{---------} \; (2) \quad (5)$$

(1) හා (2) $\Rightarrow 3v_1 = 2u + 2eu$

$$\therefore v_1 = \frac{2}{3}(1+e)u. \quad (5)$$

$A$ සඳහා, $\underline{I} = \triangle(m\underline{V}) \rightarrow$

$$I = mv_1 \quad (5)$$

$$\therefore mu = m.\frac{2}{3}(1+e)u \quad (5)$$

$$3 = 2 + 2e$$

$$\therefore e = \frac{1}{2}. \quad (5)$$

2. $u$ ආරම්භක වේගයක් ඇතිව තිරස සමග $\theta \left(0<\theta<\frac{\pi}{2}\right)$ කෝණයකින්, තිරස් ගෙබිමක් මත වූ $O$ ලක්ෂ්‍යයකින් අංශුවක් ප්‍රක්ෂේප කරනු ලැබේ. අංශුව ගුරුත්වය යටතේ චලනය වේ. ප්‍රක්ෂිප්තයෙහි තිරස් පරාසය සොයා. එය $\frac{\sqrt{3}u^2}{2g}$ නම්, $\theta=\frac{\pi}{6}$ හෝ $\theta=\frac{\pi}{3}$ බව පෙන්වන්න.




$\sqrt{3}\tan^2\theta - 4\tan\theta + \sqrt{3} = 0$

$(\sqrt{3}\tan\theta - 1)(\tan\theta - \sqrt{3}) = 0$

$R$ යනු තිරස් පරාසය යැයි ගනිමු.

$O$ සිට $A$ දක්වා, $s = ut + \frac{1}{2}at^2 \rightarrow$

$$R = u\cos\theta \cdot T. \text{ --------- } (1) \quad (5)$$

$$\uparrow\ 0 = u\sin\theta \cdot T - \frac{1}{2}gT^2 \quad (5)$$

$$\Rightarrow T = \frac{2u\sin\theta}{g}.$$

$$(1) \Rightarrow R = u\cos\theta \cdot \frac{2u\sin\theta}{g} \quad (5)$$

$$= \frac{2u^2}{g}\sin\theta\cos\theta.$$

$R = \frac{\sqrt{3}u^2}{2g}$ යැයි ගනිමු. එවිට $\frac{\sqrt{3}u^2}{2g} = \frac{2u^2}{g}\sin\theta\cos\theta$

$$\therefore \sin 2\theta = \frac{\sqrt{3}}{2}. \quad (5)$$

$$\therefore \sin 2\theta = \sin\frac{\pi}{3}$$

$2\theta = \frac{\pi}{3}$ හෝ $\frac{2\pi}{3}$ $\left(\therefore 0<\theta<\frac{\pi}{2}\right)$

$\therefore \theta = \frac{\pi}{6}$ හෝ $\theta = \frac{\pi}{3}$. (5)

3. ස්කන්ධ පිළිවෙළින් $4m$ හා $m$ වන $P$ හා $Q$ අංශු දෙකක් සැහැල්ලු අවිතන්‍ය තන්තුවකින් යා කර ඇත. රූපයේ පෙන්වා ඇති පරිදි, තන්තුව, එක එකක් තිරසට $\frac{\pi}{4}$ කෝණයකින් ආනත වූ අචල තල දෙකක මුදුනෙහි සවි කර ඇති $A$ සුමට කුඩා කප්පියක් මතින් යයි. $P$ අංශුව තබා ඇති තලය සුමට වන අතර, $Q$ අංශුව තබා ඇති තලය රළු වේ. $Q$ හා රළු තලය අතර ඝර්ෂණ සංගුණකය $\frac{1}{2}$ වේ. තන්තුව තදව ඇතිව හා තන්තුවේ $AP$ හා $AQ$ කොටස් අනුරූප තලවල උපරිම බෑවුම් රේඛා දිගේ තිබෙමින් අංශු අල්වා තබා, නිශ්චලතාවයේ සිට මුදාහරිනු ලැබේ. $P$, තලයේ පහළට චලනය වන බව දී ඇත. තන්තුවේ ආතතිය නිර්ණය කිරීමට ප්‍රමාණවත් සමීකරණ ලබාගන්න.







බල හා (5) ත්වරණ සඳහා

ත්වරණ දෙක සමාන වියයුතුය

$$F = \frac{1}{2}S \quad (5)$$

$\underline{F} = m\underline{a}$ :

(P) $\swarrow \; 4mg\sin\frac{\pi}{4} - T = 4mf$ (5)

(Q) $\nwarrow \; T - F - mg\sin\frac{\pi}{4} = mf$ (5)

